රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
பொது நிருவாக மற்றும் அனர்த்த முகாமைத்துவ அமைச்சு
**MINISTRY OF PUBLIC ADMINISTRATION AND DISASTER MANAGEMENT**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07,ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி:**(94) 011- 2694560** / Telephone
ෆැක්ස් / தொலைநகல்:**(94) 011- 2692254** / Fax
ඊ-මේල් / மின்னஞ்சல்:**dgcs@pubad.gov.lk** / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: **www.pubad.gov.lk** / Web Site

මගේ අංකය / எனது இல / My No: CS/DOS/21/01/03(තාවකාලික II)
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2019.05.22

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්/
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/
දිස්ත්‍රික් ලේකම්වරුන්/
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත

**උපචිත පදනම මත ගිණුම් කටයුතු කිරීමේ කර්තව්‍ය සඳහා නිලධාරීන් කැඳවීම**

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් සියළුම රාජ්‍ය ආයතන වල ගිණුම්කරණ ක්‍රියාවලිය උපචිත (Accrual) පදනමින් ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය වඩාත් විධිමත් ලෙස සහ කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට අපේක්ෂා කෙරේ.

02. ඒ අනුව දැනට ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන් අතුරින් ගිණුම්කරණය සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ දැනුම හා කුසලතාවය සහිත වූවන් තෝරා ගෙන අදාළ රාජකාරි සඳහා අනුයුක්ත කිරීමට අවශ්‍යව ඇත.

03. ඉහත සඳහන් රාජකාරි පැවරීමට සුදුසු නිලධාරීන් තෝරා ගැනීමේදී රාජ්‍ය කළමනාකරණ සේවයේ සහ සංවර්ධන නිලධාරී සේවයේ නියුතු (Degree holders with accounting subject, Intermediate qualification of CA Sri Lanka, Higher National Diploma in Accountancy, Managerial level qualification of CMA etc..) සුදුසුකම් සහිත නිලධාරීන් අතුරින් තෝරා ගැනීම් කළ හැකි බව වැඩිදුරටත් සඳහන් කරමි.

04. ඒ අනුව, සියළුම රාජ්‍ය ආයතන වල ගිණුම් අංශයට අනුයුක්තව ඉහත කී රාජකාරි පැවරුමට සුදුසු ඒකාබද්ධ සේවයේ නියුතු නිලධාරීන් පිළිබඳ නිර්දේශ අපට ද පිටපතක් සහිතව කොළඹ 01, මහා භාණ්ඩාගාරය, රාජ්‍ය ගිණුම දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටින අතර, වැඩිදුර විමසීම් සඳහා පහත සඳහන් දුරකථන අංක වලට අමතන ලෙසද දන්වා සිටිමි.

විමසීම් -

**ජී.එම්.අයි.යූ. බණ්ඩාර මහතා**
**සහකාර අධ්‍යක්ෂ**
**රාජ්‍ය ගිණුම දෙපාර්තමේන්තුව**
**(0775135649 /0112484600)**

කේ.වී.පී.එම්.ජේ ගමගේ
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්